**බලංගොඩ කලාප අධ්‍යාපන කාර්යාලය**

2 - වාරය

7 ශ්‍රේණිය - නර්තනය

## තාලම් නැටුම නිර්මාණය

- තාලම්පට දෑතට ගෙන වාදනය කරමින් නර්තනයේ යෙදීම විශේෂ ලක්ෂණයකි.
- බොහෝ ගැමි නැටුම් ජීවන වෘත්තියකට සම්බන්ධ වුව ද, තාලම් නැටුම එසේ නොවේ.
- එය විනෝදාස්වාදය සඳහා ම නිර්මාණය වූවකි.
- තාලම් නැටුම පිරිමි, කාන්තා දෙපාර්ශවය විසින් රඟ දක්වනු ලබයි.
- තාලම්පට දෑතට ගෙන විවිධ ක්‍රම ශිල්ප උපයෝගී කර ගනිමින් හරඹ දැක්වීම සුවිශේෂී ලක්ෂණයකි.

**මාත්‍රා 3 + 3**

අගේ වඩන මගෙ තාලම් හරඹ බලන්නේ
වගේ නො දැන ඇයි නුඹලා කීමට එන්නේ
කගේ ගිල්ල ලෙස බැරිවෙයි නුඹට බොලන්නේ
මගේ දෑත තාලම්පට හරඹ බලන්නේ

**මාත්‍රා 4 + 4**

සඳවට තරුවැල් ඇවිදින් කල එළි සද්දේ
මඳකොට පවසමි ඇවිදින් ඇරඹුණ යුද්දේ
යුදයට වසවතු ඇවිදින් පැරදුණ යුද්දේ
බඳවට කැරකෙන මගේ තාලම්පට සද්දේ

ක්‍රියාකාරකම

01. නියමිත තාල රූපයට අනුව තාලම් කවි ගායනා කරන්න.
02. තාලම් නැටුමකට සුදුසු පද හතරක් නිර්මාණය කරන්න.

සැකසුම ඃ සිතාරා පවිත්‍රානි මිය
ර/ විද්‍යාකර මහා විද්‍යාලය

Balangoda Zonal Education